

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 55 වන කාණ්ඩය | බු.ව. 2556 නිකිණි මස පුරපසළොස්වකදා<br>ක්‍රි.ව. 2012 අගෝස්තු මස 01 වන දා | 04 වන කලබ |
|---|---|---|

# ගසක පාඩම

සුහුඹුල් ගසකි වටිනා පල දෙන මිහිරී
අවු වැසි සුළං නැග ආවත් වී එදිරී
විඳිමින් ඒ පහර ඉවසා නො කළකිරී
සිය මෙහෙවර කරයි ඒ ගස ලබා දිරී

කොහෝ කුරුලු කූජනයෙන් ලැබ පැසැසුම්
පලවැල නොහැර කපුටන් කෙරුවත් පැහැරුම්
මේ එකකිනුදු නො පිපී නො තැවී විහිගුම්
මේ ගස තිරසර ව සිටිනා සැටි මනරම්

පුහු මානයෙන් සිත පිම්බෙන විට ඉදිමී
දුහුවිලි රිදුම් අවමන් එන කල දී නැමී
ඒ දුක අහන්නට සිටි මවුපියෝ අහිමී
මම නිරතුරු ව ඒ ගස හෙවණෙහි රැදෙමි

- **අනඳ**



# බුදු බව හා බෝසතාණෝ

නිව්යෝක් බෞද්ධ විහාරාධිපති
**අතිගරු කුරුණෑගොඩ පියතිස්ස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි**

මහායාන බුද්ධාගමෙහි බොහෝ දෙනාගේ ප්‍රාර්ථනාව බුදු බවට පැමිණ ම නිවන් දැකීමටයි. ''බුද්ධ'', බෝධි'' වැනි වචනවල අදහස හරිහැටියට වටහා ගත නොහැකිවීම නිසා මහායානිකයෝ බොහෝ තැන්වලදී බුදුරජාණන් වහන්සේගේත්, බෝධිසත්ත්වයන් වහන්සේගේත් තත්ත්වය එක සමාන කොට සිතන්නට පුරුදුව සිටිති. ථේරවාද බුද්ධධර්මයත්, එය ප්‍රකාශවෙන පාලි භාෂාවත් හරිහැටි නොදැනීම නිසා මේ අවුලට ඔවුන් වැටී ඇතැයි සිතමි.

අපේ ථේරවාදී බෞද්ධ පොතපතේ හැටියට බුද්ධත්ත්වය ලබා ගත හැක්කේ චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන් ය. ඒ සඳහා බෝධිසත්ත්ව කෙනෙක් බොහෝ දීර්ඝ කාලයක් දස පාරමිතාවන් පිරිය යුතු ය. ඒ තමන්වහන්සේ සංසාරිකව ගෙනෙන ලෝභ දෝෂ මෝහාදියෙන් පිරුණ සිත එයින් ඉවත් කර ගැනීමට ය. එසේ කිරීමේ දී උන්වහන්සේලා දශ පාරමිතාවන් වශයෙන්ද මේ දශවිධ පුණ්‍ය ක්‍රියාවන් තිස් ආකාරයකින් පිරිය යුතු ය.

එසේ පාරමිතාවන් පුරන කාලය තුළ උන්වහන්සේලා ථේරවාදයට අනුව හඳුන්වන්නේ බෝධිසත්ත්වවරුන් ලෙසට ය. බෝධිසත්ත්වවරයෙකු කරන්නේ ලෝකයෙන් අතුරුදන්ව පවත්නා චතුරාර්ය සත්‍ය නැවතත් ලෝකයට හඳුන්වා දීම

සඳහා අවශ්‍ය මානසික දක්‍ෂතාවය ඇතිකර ගැනීම පිණිස කරන උත්සාහයකි. ඒ ලෝකයේ පවත්නා සදාකාලික තත්ත්වයක් වූ, අප කාගේවත් මනසෙහි මේ මොහොතේ පවා ස්ථිරව වැටහීමක් නැතිව ඇති වෙනස්වන ස්වභාවය අනිත්‍යභාවය ගැන ඇති අවබෝධයක් නැතිකම අප ධර්මයෙන් ඈත්වන්නට ඈත් වන්නට ම අපෙන්ද තව තවත් ඈතට ඉවත්ව යන බැවිනි.

එහෙයින් සසර බිය දක්නවුන් විසින් ඉන් මිදීමට මග පෙන්වා වදාළ බුදුරජාණන් වහන්සේ ලෝකයට හෙළිකර දුන් චතුරාර්ය සත්‍යය ධර්මය පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමට නිතර දෙවේලේ බුදුගුණ සිහි කරමින් සිත්හි කුසල් සිත් ඇතිකර ගැනීමටත් ඒ මගින් සිත්හි ශ්‍රද්ධාව වර්ධනය කර ගැනීමටත් උත්සාහ කිරීම අත්‍යවශ්‍ය බව නිතර සිතිය යුතු ය.

සසරින් මිදීමට උත්සාහ කරනවුන් විසින් බුද්ධානුස්සති, මෙත්තා, අසුභ සහ මරණානුස්සති යන භාවනාවන් නිතර දෙවේලේ මෙනෙහි කළ යුතු ය. වැඩිය යුතු ය. ආසේවනය කටයුතු ය.

මෛත්‍රිය වැඩීමෙන් පටිඝය නම් වූ තරහ සිත් ඇති නොවීමත්, අසුභානුපස්සනාව වැඩීමෙන් රාගය ඇති නොවීමත්, මරණානුස්සතිය වැඩීමෙන් ජීවතයේ අනිත්‍යතාවය ගැන සිතන්නට පුරුදු වීමෙන් මරණයට නොබියව මුහුණ දීමටත් සුදුසු නුවණ ලැබෙන බැවින්, මෙය ''සතර ආරක්‍ෂාව''යයි ද කියනු ලැබේ. මේ සතර භාවනාවෙන් යුක්ත පුද්ගලයෝ මරණින් මතු සුගතිගාමී වන අතර නිවනට මග හෙළි කරගන්නවුන් බවට ද පත් වෙති.

එසේ ජීවත් වීමෙහි ආනිශංස වශයෙන් බුදුරජාණන් වහන්සේ එවැන්නන්ගේ ධනය සහ දියුණුව වැඩෙන බැව්ද, ඔවුන්ගේ සැප පහසුකම් වැඩිවන බැව්ද මිත්‍ර නොවන්නවුන් පවා මිත්‍ර වීමට සුදුසු පරිදි සකස් වන බැව්ද පෙන්වා දී ඇත. සමාන සිතින් සමව පින්

දහම්හී යෙදී සමානව සතුටුවීමෙන් පරලොව දිව්‍යභාවයන් ලබා එහිදී ද එවැන්නවුනට සතුට ලැබෙන බවත් වදාරා ඇත.

දෙදෙනෙකු වූ කල ඔවුනොවුන් අතර ඇතිවන අසමාන කම් වළක්වාගත හැක්කේ දෙදෙන සමසිතින් යුක්තව පින්දහම්හි යෙදීමෙන් මිස වාදවිවාද පටලවා ගෙන ගැටීම් ඇතිකර ගැනීමෙන් නොවේ. පින් දහම්හි යෙදෙන විට ඒවා වාදවිවාදවලින් තොරව කරගැනීමට තරම් සුදුසු වන ආකාරයේ දහම් දැනීමක් ළමා කාලයේ දී ම වැඩිහිටියන් ඇසුරෙන් ලබාගත හැකි ය. වැඩිහිටියෝ දරුවන්, බාලයන් කෙරෙහි අනුකම්පාවෙන් හිතකාමීව පින්දහම්හි යොදවා ජීවිතයට හුරුපුරුදු කරවන්නේ එබැවිනි. දරුවන්ට බාල කාලයේ දී හරිහැටි දහම් නොඉගැන්වීමේ ආදීනව බොහෝ ය. එහෙයින් වාසනාවන්ත වීමට දහම් දැනුම ඇතිකර ගත යුතු ය. අපෙන්ද ඒ අවබෝධය තව තවත් ඈතට ඉවත්ව යන බැවිනි.

කල් යත් යත්ම විවිධ ධර්මාන්තරාය පැමිණීමෙන්, පවත්නා බුද්ධධර්මය වටහා ගැනීමටත්, අවබෝධ කර ගැනීමටත්, මෝහාන්ධකාරයෙන් මුළා වූ සත්ත්වයන්ට වඩ වඩාත් අපහසු වන්නේ ඔවුන් කාමක්ලේශයන්ගෙන් මුළාවට පැමිණ බුද්ධියෙන් හීනවන බැවිනි. සතුන්ගේ සිත්වලින් කාමච්ඡන්දය මිස ධම්මච්ඡන්දයක් එසේ මෝහන්ධකාරයෙන් මුළාවන කාලවල ඇතිවන්නෙ බොහෝ දුර්ලභව ය. එසේ වූ කාලවල ලෝකයෙහි පහළවන්නේ පසේ බුදුවරුන් පමණකි. සම්මා සම්බුදුවරුන් පහළ නොවීම සිරිත ය. ඒ බුදුබවට පත්වීමේ පවත්නා අපහසුකම නිසා ය. බුදුවරුන් ලොව පහළ වන්නේ කල්ප ගණන් ගතවීමෙනි. නිතර දෙවේලේ බුදුවරුන් ගේ පහළවීමක් නැත.

බෝධිසත්ත්වවරුන් ලෝකයෙහි සැමදාම පහළව සිටින බව කිවමනා නොවේ. බුදු බව ප්‍රාර්ථනා කරන කවර කෙනෙකු වුව ද බෝධිසත්ත්වවරයෙක් යයි හැඳින්විය හැකි ය. එහෙත් බුදුවරයෙකුගෙන් නියත විවරණ ලබන ලද බෝධිසත්ත්වයන් වහන්සේ ම සැබෑ බෝධිසත්ත්ව කෙනෙක් වන්නෝ ය. එවැනි

බෝධිසත්ත්වවරු ඒ කාලවල ලෝකයෙහි උපදිති. එවැන්නන්ගේ ඉපදීම ද සිදුවන්නේ ලෝකය දහැම්ව පවත්නා කාලවල ය. මහායාන රටවලට බුද්ධ ධර්මය සංක්‍රමණය වීමේ දී ඇතිවුණ දුෂ්කරතාවන් නිසා බුදු, පසේබුදු, මහරහත් සහ බෝසත් යන උතුමන් පිළිබඳ පැහැදිළි පොදු අවබෝධය සාමාන්‍ය බෞද්ධ ජනතාව තුළින් ඉවත්ව බෝධිසත්ත්ව සංකල්පයක් වැදගත් තැනකට පැමිණියේ ය.

කෙසේ වෙතත් බෝධිසත්ත්වයන් වහන්සේලා බුදුසමයෙහි කොතෙකුත් සිටිති. ථෙරවාදයෙහි වුවත් මහායානයෙහි වුවත් උන්වහන්සේලා බෞද්ධයන්ගේ අකලංක ගෞරවයට පාත්‍රවෙති. මතු බුදුවන උතුමන්වන බැවිනි. මතු බුදු බව ලබන උතුමෝ මහත් පින් කොට බුදු බව ලබන බැවිනි. එහෙත් බුදුබව ලැබීම අපේ පොදු සමාජය සිතන පතන තරම් පහසු කාර්යයක් නොවන බව මෙහි සඳහන් කරන්නේ බුදු බව පතන්නවුන් ධෛර්යවත් කරවීමට මිස අධෛර්යවත් කරවීමට නොවේ.

ලෝකයේ බුදුවරයෙකුට වඩා උසස් තවත් කෙනෙක් නැත්තේ ය. දෙවියකු වීම හෝ බ්‍රහ්මයකු වීම හෝ මනුෂ්‍යයකු වීම පවා මහත් ආයාසයකින් දුර්ලභව ලැබියයුතු දෙයක් බව බුදුරජාණන් වහන්සේ විසින් ම වදාරා තිබේ. එහෙයින් දේවාතිදේව වූ, බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, මාරාතිමාර වූ බුද්ධත්වය ලැබිය හැක්කේ නරවීරයන් වහන්සේ කෙනෙකුට බව වදාරා තිබේ. එහෙයින් දේවාතිදේව වූ, බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, බෝධිසත්ත්වයා කරන, කියන සහ සිතන සියලුම කාය-වාග්-මනස් යන තිදොරින් සිදුවන සෑම දෙයක ම ප්‍රතිඵල ඇතිවීම ස්වභාවයයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණ වදාරා සිත, විසංඛාර ගත වූයේ යයි ප්‍රීති වාක්‍ය පහළ කළෝ (විසංඛාරගතං චිත්තං) උන් වහන්සේ ගේ සිත ද සසර දී පළමු වරටත් අවසන් වරටත් එසේ වූ බැවිනි. සිතෙහි කර්ම විපාක දීමේ සත්‍ය නැතිව ගොස් සිත විසංඛාරගත වූ බැවිනි. ඔබ සැම ද සිත ඒ තත්ත්වයට පත් කර ගන්නට උත්සාහ වඩත්වා !



# දැයේ පිනින් පහළ වූ කුමාරතුංග මුනිදාස මහ පඬිරුවන

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 125 වන කුමරතුගු මුනිදස් උපත් සමරුව වෙනුවෙන් නිකුත් කළ විශේෂ පණිවිඩයයි

හෙළ බස් සක්විති කුමාරතුංග මුනිදාසයන් ගේ 125 වන ජන්ම සංවත්සරය වෙනුවෙන් මෙබඳු පණිවිඩයක් නිකුත් කරනුයේ එතුමන් ගේ ගුණ සුවඳ සිහිපත් කිරීම සඳහා මෙන් ම හෙළයට කළ මහ මෙහෙවරට ගරු කිරීම් වශයෙනි.

අප හෙළ බස් සක්විති සියවසක් ආයු නොලද ද කළ මහ මෙහෙවරේ කිත් යසස් වසර සිය දහස් ගණනක් ආයු ලැබුයේ වෙයි. ඒ කිතුගොස හෙළය ද හෙළ බස ද පවතින තුරු නො නිමෙයි. මතු දිනයෙහි ජනයා දෙව් රූ නොව කුමරතුගු රුව ම ඒ තැන්හි හිඳුවා වැඳුම් පිදුම් කරනු ඇති බව මහ සඟ රුවන එදා කීවේ ඒ බැවිනි.

රජයක් බිහි වන විටත්, රජයක් කරවන විටත්, රජය යන වදන යොදන සැම තැන්හි මත් මෙතුමන් සිහිගැන්විය යුතු බව අප වැටහීම ය. ඒ ආණ්ඩුව යන වදන වෙනුවට රජය යන වදන නිපදවූයේ කුමාරතුංගයන් වන නිසා ය. රජය කරවන ඇත්තන් පමණ ද? මහ මඟ පා පැදියෙන් යනෙන

මඟියාට ද එතුමන් අමතක කළ නොහේ. පාපැදිය, රෝහල, හෙදිය, අණුව, පරමාණුව, බැති ගීය, මුදල් ඇණවුම, කම්ටුව, වෙළුම, පාදඩයා යනාදි පොදු ජන වහර නිපදවූයේ මේ බස් වඩුවාණන් වූ නිසා ය.

**''අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොවැ නො නඟී''** යනු එතුමන් ගේ රට පතළ කියුමකි. ලිවීමෙහි දී කයෝර ව තිබූ බස් වහර ඇද කුද හැර නමා අලුත් වදන් තැනූ කුමාරතුංගයන් තනා දුන්නේ අලුත් දෙයකි. නවීන විද්‍යාවන් කීමට, ලිවීමට, ඉගැන්වීමට හෙළ බස පොහොසත් බව පෙන්වා දෙමින් ද නව වදන් ගොන්නක් තනමින් ද පැරණි පොත පත පිරිපහදු කරමින් ද හෙළ හවුල නම් සංගමය මුළු දෙවමින් ද සිංහලය වැඩෙහි යොදන්නන් ගේ දිරි බල වඩා තිබූ බැවින් 1956 දී සිංහලය රජ බස බවට පත් කිරීමට හැකි විය. කොළඹ ඉහළ පවුල්වල මෙහෙකරුවන් ගේ බස බවට පත් ව තිබූ හෙළ බස රජ බස වීමේ සම්මානයේ වැඩිපුර ඇත්තේ කුමාරතුංගයන්ගේ වෙහෙස මහන්සිය  ය.

කුමාරතුංග මුනිදාසයන් ගේ මෙහෙවර ඇරඹුණේ ලක්මව ගේ නිදහස් සටනේ අරුණෝදයේ දී ය. ඒ සමයේ විදෙස්වලින් ගත් වාද ද නා නා සමයන්ගෙන් මතු වූ වාද විවාද ද බොහෝ විය. එහෙත් මඟ හොඳට තිබියදී බැදිවල යෑම කුමරතුඟුවන් නොරිසි විය. ඒ කිසිදු න්‍යායක වාදයක නො ඇලී අදීන ව මවු බිමේ නිදහස පැතුවේ ය. වෙහෙසුණේ ය.

එතුමන් ගේ සමයේ වත්මනෙහි ඉන්නා වියතුන්ට තිබෙන නව මෙවලම් හෝ කටයුතු පහසු කරන දෑ නොවූයේ ය. ඉඩ හසර ද නොවී ය. එහෙත් හෙළයාගේ කම්මැළිකමට බැට දී දිරියට පිට දී එම අල්ප වූ ජීවිත කාලය තුළ මඟුල් කෑම, හත් පණ, හීන් සැරය, ලක්මිණි පහන, සුබස, පහන වැනි පොත් පත් සඟරා පත්තර රැසක් කරවූහ. දිවිය හර නැති එඬරු ගසක් නොවී හර ඇති එල ඇති ගසක් ම වී ය.

කුමාරතුංග මුනිදාසයන් දිවි සැරිය ඇරඹුවේ ගුරුවරයකු වශයෙනි. පසුව ගුරුන්ගේත් ගුරු වූහ. ඒ විදුහල්පති ධුරය සේ ම නිට්ටඹුව, බලපිටිය ආදි ගුරු අභ්‍යාස විදුහල්පති බවට පත් වීමෙනි. එ මතු නොව එතුමන්ගේ උදාර කටයුතු මෙ රට ඉන්නා සෑම ගුරුවරයකුට ම මනා මඟ පෙන්වීමක් වන්නේ ය. විදුහල්පති ව සිටිය දී සිසුවකු නැඟූ පැනයකට පිළිතුරු සොයනු රිසියෙන් කළ පර්යේෂණය සිංහල ව්‍යාකරණයට නව එළියක් විහිදුවේ ය. එ බඳු ගුරුවරුන් නොවෙද අපට ඇවැසි?

දෙස-රැස-බසට ආදරය මිනිය යුත්තේ යමකු දරුවන් කෙරෙහි දක්වන ආදරය මත ය. දෙස-රැස-බස යනු දූ පුතුන් සහ නූපන් දරුවෝ ය. රටට ඇල්ම ඇත්තෝ ඔවුන්ට ඇලුම් කළ යුත්තෝ ය. ඔවුන් ගේ උදාරත්වය පිණිස මෙහෙවර කළ මෙහෙය විසල් ය. සුවිසල් ය. කුමර ගී, හත් පණ, මඟුල් කෑම, හීන් සැරය, ශික්ෂා මාර්ගය ඒවා ය. හීන් සැරය මස නොව මනැස මෙහෙයවා නිර්භීත ව වැඩ කිරීමේ ආදීනව ජාතියට උගන්වයි. මඟුල් කෑම කතාවේ එන නරියා හා කුකුළා දරුවන්ට කියා දෙන්නේ කපටින්ටත් ඔවුන්ගේ විසුළු බස්, චාටු බස්වලටත් නොරැවටෙන්නට ය.

ඒවා බස මනැස මතු නොව නැණැස ද වඩවනු අපට පෙනෙයි. ජාතියට ඇවැසි ප්‍රඥාව මේ ගී කතා තුළ බහා හීන් සැරයේ දරු පරපුරේ ඇතුළු හදට කා වැද්දවූ අයුරු මනරම් ය. කුමර අවදියේ දී ඒ පොත් පෙළ කියවා නිසි ලෙස වටහා ගත්තේ නම් අප රට තිස් වසක් පුරා ව්‍යාජ සාම කතාවන්හි සහ නා නා නරින් ගේ ගොදුරු බිමක් බවට පත් වන්නේ නැත.

දයක් නැංවීමට නම් වීරත්වය මහා සාධකයක් වන බව දය නැංවීමට උත්සාහ දූරුවෝ දනිති. අභිමානය පිළිබඳ හැඟීමෙන් ජාතියේ හදවත පිරී නැති නම් කොතරම් සම්පත්

මහ පොළොව මත තිබුණත් එම දූය නැඟී සිටවනු නොහේ. කුමාරතුංගයන් ගේ සේවය වැදගත් වන්නේ එතැන්හි දී ය. ජාතියේ අභිමානය ජාතියේ දූ පුතුන්ගේ හදවත්වලට කා වැද්දවීමට කළ සේවය අසමසම ය. එය එසේ කිරීමට හැකිවූයේ මුනිදාසයන් ගේ හදවත ද වීරත්වයෙන් පිරී දෑ අභිමානයෙන් ඔද වැඩී තිබූ නිසා ය.

කුමාරතුංගයන් පහළ වූයේ දූයේ පිනෙනි. එසේ ම දූයට කළ මෙහෙයෙන් ඔවුහු මහත් පින් රැස්කළෝ ය. නිවන් පුර වැද සැනසෙන්නට පෙර ඒ පිනින් ඔවුහු දෙව් ලොව ගියාහු නම් ඔවුන් ගෙන යන එක් දෙයක් වෙයි. ඒ මියැසියක් තරම් මිහිරි වූ හෙළ බස ය. දෙව් ලොවට ගිය ද ගෙන යා හැකි තරම් හොඳට එතුමන් හෙළ බස වටිනා දෙයක් බවට පත් කළ බව කියන්නේ මහත් ගෞරවයෙනි.

අදිටන බලවත් ද - සියලු මැ සිතුම් පැතුමුත්
අදහස් පරිදි සිදුවේ- නැති වැ මැ කිසිදු අඩුවක්

තිරුවල්ලුවර් කවියා ගේ ''තිරුක්කුරළ් '' නම් දෙමළ කාව්‍යයට ශ්‍රී චාල්ස් ද සිල්වා සූරින් කළ ''සිරිගීය'' නමැති සිංහල අනුවාදයෙනි.



# ශ්‍රී ලංකාවේ අමද්‍යප ව්‍යාපාරය සිය වස සමරයි

මහරගම සිරි වජිරඤාණ දහම් පාසලේ ප්‍රධානාචාර්ය
**ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය හක්මන සුමනසිරි හිමිපාණෝ**

ශ්‍රී ලංකාවේ අමද්‍යප සටනට වසර සියයක් සපිරේ. අප රටට නිදහස ලබාගැනීමේ ව්‍යාපාරයත් සමඟ ක්‍රියාත්මක වුණු නැතහොත් නිදහස් ව්‍යාපාරය සඳහා පදනම් වූ වැඩ පිළිවෙළක් ලෙස ආරම්භ වූ සංවිධානයක් ලෙස අමද්‍යප ව්‍යාපාරය හැඳින්වීම නිවැරැදි ය. 1895 දී පමණ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා සහ එතුමාගේ අනුගාමික දේශහිතෛෂී පිරිස සුද්දන් විසින් සිංහල ජාතියට පුරුදු කරවන ලද මත්දිය නිසා වන උවදුර දැක ඊට විරුද්ධ ව ක්‍රියා මාර්ගයක් ආරම්භ කර තිබුණි. 1912 අප්‍රේල් මස ව්‍යවස්ථාදායක සභාව මඟින් සුරාව ව්‍යාප්ත කරලීම සඳහා නව පනතක් ඉදිරිපත් කරන ලදි. ශ්‍රී ලංකාවේ දේශප්‍රේමීන්ට අධිරාජ්‍ය විරෝධී අරගලයක් කිරීමට මෙය ප්‍රධාන නිමිත්තක් විය. බෞද්ධයන් අතරත් සාමාන්‍ය මහජනයා අතරත් මත්පැන් හැදීම, විකිණීම, පාවිච්චි කිරීම, අනුන්ට දීම වැළැක්වීම සඳහා විශේෂ රැස්වීමක් කොළඹ ආනන්ද මහා විද්‍යාලයට කැඳවන ලද්දේ 1912 මැයි 25 දින දී ය.

ඩබ්. ආතර් ද සිල්වා මැතිතුමා ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු යථෝක්ත රැස්වීමට විද්‍යෝදය පරිවේණාධිපති

ව වැඩ විසූ අතිගරු මහගොඩ ඥාණිස්සර නාහිමියන් ඇතුළු විශාල භික්ෂු පිරිසක් ද ඇමරිකන් ජාතික සී. ටී. ස්ට්‍රවුස්, අධිනීතිඥ ඇප්. ආර්. සේනානායක, ඩී. එස්. සේනානායක, නීතිඥ සී. බටුවන්තුඩාවේ, නීතිඥ ජෝන් ද සිල්වා, වලිසිංහ හරිශ්චන්ද්‍ර, සී.ටී. ප්‍රේදිස්, හෙන්රි අමරසූරිය ආදී ප්‍රභූහු රාශියක් ද සහභාගි වූහ.

මෙම මුල පිරීම අනුව 1912 ජූලි මස 14 වන දින කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ දී ශ්‍රී ලංකා අමද්‍යප මහා සභාව ඉහත සඳහන් කරන ලද ජාතිහිතෛෂීන් විසින් පිහිටුවාගනු ලැබුයේ සුරා විරෝධී සටන බලවත් කොට එ මඟින් ජාතික නිදහස ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. කලින් සඳහන් කළ ප්‍රභූන්ට අමතර ව ශ්‍රීමත් ඩී.බී. ජයතිලක, එච්. ඩබ්. අමරසූරිය, සී. ඒ. හේවාවිතාරණ, ඩඩ්ලි සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක යන ජාතික නායකයන් ගේ ද පී. රාමනාදන් වැනි අබෞද්ධ නායකයන් ගේ ද ක්‍රියාකාරී සහයෝගය මීට නොමඳ ව ලැබුණි. 1918 ජාතික සංගමය බිහි වන්නේ ද අමද්‍යප සභාවේ ම අතුරු ප්‍රතිඵලයක් වශයෙනි.

අමද්‍යප නායකයන් ජාතික සංගමය මඟින් නිදහස් දේශපාලන සටනට බැස ගැනීම නිසා අමද්‍යප සභාවේ බලාපොරොත්තු මඳින් මඳ බොඳ වී යන්නට පටන් ගත්තේ ය. අමද්‍යප සංගමයෙන් මතු වුණු දේශපාලන ප්‍රභුවරුනට අමද්‍යප අරමුණ ටිකෙන් ටික අමතක ව යන බවක් පෙනුණි. මේ හේතුව නිසා අමද්‍යප සභාව ද අක්‍රිය ස්වභාවයට පත් විය.

වසර ගණනකින් පසු අමද්‍යප මහා සභාවේ නායකත්වයට පත් වූවාහු අතිපූජ්‍ය කළුකොඳයාවේ පඤ්ඤාසේඛර මහානායක මාහිමියන් වහන්සේ ය. (1934 - 1977) සුරාව පිටුදැකීම සඳහාත් අපරාධ මර්දනය සඳහාත් ගමක් ගමක් පාසා

වැඩම කරමින් ධර්මදේශනා පවත්වමින් උන් වහන්සේ ගත් උත්සාහය සැබැවින් ම ප්‍රශංසනීය ය. සුරාවෙන් තොර වූ ශ්‍රී ලංකාවක් දැක අපවත් වන්නට ලැබේ වා යි උන් වහන්සේ අවසන් කාලයේ දී ප්‍රාර්ථනා කළත් එය ඉටු කරගැනීමට නොහැකි විය.

ඉන් පසු ඒ තනතුරට පත් වූවාහු අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන් වහන්සේ ය. (1977-2003) ''මිනිහා හදා රට හැදීමේ'' තේමාව මුල් කරගනිමින් 'අමද්‍යප රටක් ' හදා ගැනීම සඳහා මුළු දිවිය ම වැය කළ උන් වහන්සේ අමද්‍යප ව්‍යාපාරය වඩාත් ප්‍රගති මාවතකට ගෙන ඒමට සමත් වූහ.

වත්මන්හි අමද්‍යප සභාවේ සභාපති ධුරයට පත් ව සිටින්නාහු අතිගරු හාරිස්පත්තුවේ අරියවංශාලංකාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. දේශබන්ධු ඕල්කට් ගුණසේකර, වෛද්‍ය අනුලා විජේසුන්දර, පී.බී.ඒ. දිසානායක දේවගැතිතුමා ආදී වර්තමාන අමද්‍යප සටනේ පුරෝගාමී පිරිස සුරාවෙන් තොර සෞඛ්‍යසම්පන්න සමෘද්ධිමත් සමාජයක් ඇති කරගැනීමට බලවත් වෙහෙසක් ගන්නා බව නොරහසකි. අද 'මහින්ද චින්තන' වැඩ පිළිවෙළෙහි ද 'මතින් තොර ශ්‍රී ලංකාවක්' පිළිබඳ බලාපොරොත්තුවක් සටහන් කර ඇත. එහෙත් මත්දිය-මද්ද්‍රව්‍ය භාවිතයෙහි තව ම අඩුවක් දක්නට නැත. අමද්‍යප සභිකයන් පමණක් නොව සාධු සත්පුරුෂ මහජනයා ද අපේක්ෂාවෙන් සිටින්නේ ඒ බලාපොරොත්තුව ඉටු වන තෙක් ය.



# සාරම්භ ජාතකය

කොළඹ විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන එක් සමයක භික්ෂූන් වහන්සේලාහට අපහාස වන ලෙස අමතන භික්ෂුවක් සිටියේ ය. මේ නිසා උන්වහන්සේ කිසිවෙකුහට ප්‍රිය මනාප නොවූහ. මෙම භික්ෂුව ප්‍රිය මනාප භික්ෂූන් වහන්සේලා ගේ ජාති, කුල මතුකරමින් අවමන් කළේ ය. සැවොම පිළිකුල් කළ එම භික්ෂුව හට බුදුරජාණන් වහන්සේ අවවාද කළ සේක.

''නොසරුප් වදන් මිනිසුනට පමණක් නොව තිරිසන් සතුන්ටත් ප්‍රිය නොවන්නේ ය.''

යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළ සේක. මෙම අවවාදය පැහැදිලි කිරීම පිණිස අප බුදුරජාණන් වහන්සේ මෙම සාරම්භ ජාතකය වදාළහ.

ඈත අතීතයේ දඹදිව ගන්ධාර නම් රාජ්‍යයෙහි ගන්ධාර නමින් යුත් රජතුමෙක් රාජ්‍ය කළේ ය. මෙම රටෙහි ගව පට්ටි හිමි බමුණන් මෙන් ම සිටුවරයෝ ද තමනට අයිති ගොනුන් ගේ ශක්තිමත් බව පෙන්වීම සඳහා තරග වැදුණහ. ජය ලබන ගවයාගේ හිමිකරුට පඩුරු ලෙස කහවණු දහස, දෙදහස සුදුසු පරිදි ලබා දුන්හ.

මෙකල අප මහ බෝසතාණෝ ගව කුලයක උපත ලදහ. එක් බමුණෙකුගේ ගව පට්ටියේ උපත ලැබූ මෙම වසු පැටියාට 'සාරම්භ' ලෙස නම් කර තම දරුවෙකුට මෙන් සලකනු ලැබිණ. මෙම වසු පැටියා තරුණ බවට පත් වූ විට හොඳින් නහවා, කවා පොවා ඇති දැඩි කළ මුත්, කිසිදු බර වැඩකට යොදා ගත්තේ නැත. ඉතා ශක්තිමත්ව වැඩුණු සාරම්භ තරුණ ගවයා, තමා දුකසේ පෝෂණය කරන්නා වූ බමුණාට කළගුණ සැලකිය යුතුයි ඉටා ගති. බමුණාට තමා ශක්තිමත් බව හැඟවීය. බමුණා ගව සම්පත් හිමි සිටුවරයෙකු වෙත ගොස් තමාට එකවර ගැල් සියයක් ඇදිය හැකි ගවයකු සිටිනාබව කීය. සිටුවරයා ''එසේ නම් තරගයට ඉදිරිපත් කරන්න. මම කහවණු දහසක් ගෙවමි'' කීවේ ය.

නියම කරගත් දිනයේ ගල් වැලි පිරවූ ගැල් සියයක් පෙළ ගස්වා තිබුණි. බමුණා සාරම්භ ගවයා නහවා, කවා, මල්මාලා පළඳවා තරග බිමට ගෙන ගොස් ''තමා කුළු හරකෙකු යැයි සිතව. දැන් කුළු හරකා ගැල් සියය ඇදව'' යනුවෙන් සැරවැර විය. තමාට කුළු හරකා යැයි නින්දා කළ නිසා මෙම ගැල මම නොඅදිමි'යි සිතූ සාරම්භ ගවයා පාද සතර නො සොල්වා නිසලව සිටියේ ය.

තම ගවයා තරගයෙන් පරාජය වූ නිසා බමුණා ශෝකයෙන් පසු විය. සාරම්භ පැමිණ '' මෙපමණ කලක් ඔබ නිවසේ සිටිය දී මා කුළු හරකෙකු මෙන් හැසිරී ඇත් ද? '' යනුවෙන් ඇසී ය. නුසුදුසු කිසිවක් ඔබ කළේ නැතැයි කී බමුණාට ''මා හට හොඳින් කථා කරන්නේ නම් තරගයට නැවත ඉදිරිපත් වන්නෙමි'' සාරම්භ ගවයා කීවේ ය.

නැවත සිටුවරයා මුණ ගැසුණු බමුණා තම ගවයා නැවත ඉදිරිපත් කරන බව පැවසී ය. මෙවර තෑගි මුදල කහවණු දෙදහසකි. සාරම්භ බෝසත් ගවයා ගැල් සියය ඉදිරියට

ගෙන ගොස් හිස අත ගෑ බමුණා, ආදරයෙන් කතාකොට ''පුත සාරම්භ, දිරිය ගෙන ගැල් පේළිය අදින්නැ'යි කී ය.

එවිට සාරම්භ ගැල් සියය එක පහරින් ම ඇද පසු පස ම තිබූ ගැල ඉදිරියට ගෙන ආවේ ය. නැරඹීමට ආ මිනිසුන් බොහෝ මුදල් සාරම්භ ගවයා වෙනුවෙන් බමුණාට ලබා දුන්හ. බමුණා ඉතා සතුටට පත්විය.

යහපත් වචනයෙන්, ප්‍රිය මනාප ව තමා ඇමතූ නිසා බමුණා හට සාරම්භ ගවයා ජය ලබා දුන්නේ ය. එමගින් බමුණා පෝසතෙක් විය.

අනුනට අවමාන කිරීමට ගොස් තමා අවමානයට, පිළිකුලට පත් වූ භික්ෂුව අමතා මේ ජාතක කථාව බුදුරදහු දෙසූ සේක. අවවාද දුන් සේක. එනම්

''සැමට ම ප්‍රිය වචන සැමවිට ම කිව යුතු ය. මුසාවාද, පිසුණ වචන, පරුෂ වචන, සම්පප්ප්‍රලාප නොකිය යුතු ය. එසේ කියන්නෝ මෙලොවත් පරලොවත් පසුතැවිලි වෙති. පිරිහීමට පත් වෙති.''

මේ අවවාද ඔබ සැමහට හොඳ ළමයකු වීමට මඟ පෙන්වයි. එම නිසා හොඳ ළමයකු වීමට ඔබත් ඉටා ගන්න.

එකල බ්‍රාහ්මණයා නම් දැන් ආනන්ද තෙරණුවෝ ය. සාරම්භ ගවයා බුදුරජාණන් වහන්සේ ය.



සිරිත් මුතුහර - 04

# බසට බුහුමන් කිරීම

**"ගුරු සීයා" විසිනි**

මවට, පියාට ගරු බුහුමන් කිරීම, වැඩිහිටියනට, ගුරුවරුනට ගරු බුහුමන් කිරීම, සිංහලයාට බෞද්ධයාට ආවේණික වූ සිරිතකි. අපේ ආගම දහමින් ඒ ශික්ෂණය ජනතාවට ලැබී ඇත. එ පරිද්දෙන් ම ඔවුනට උපකාර වන, ඔවුන් භාවිත කරන මෙවලම් ආදියට ද කිසියම් ආකාරයක බුහුමනක් දක්වීමට ඔවුන් හුරු වී ඇත. ගොවි මහතා ගොවිතැන් කිරීමට පෙරත් අවසන් වූ පසුවත් උදැල්ලට වැඳ ආචාර දක්වන්නේ ඒ සිරිත් අනුව ය. ළමා කාලයේ පටන් අපිදු අප පත පොත කියවා අවසන් වූ පසු එය මේසය මත තබා වැඳීමට පුරුදු ව සිටිමු. එය අපට නුවණ ලබා දෙන වටිනා ම මෙවලම වන බැවිනි.

මේ කී ලෙසින්, අප ලියන කියන භාෂාවටත් ගරු බුහුමන් කිරීම පෙරදිග මිනිසුනට හුරු වූ සිරිතකි. එහිලා ද ශ්‍රී ලාංකිකයන් වන අපට විශේෂයක් ඇත. ඥානය (නුවණ) ලබා දෙන අකුරටත් අකුරින් නිර්මාණය කළ පත් පොත්වලටත් යට කී ලෙස අප ගරුසරු දක්වන්නේ එ හෙයිනි.

| | |
|---|---|
| උදය මැ නින්දෙන් | නැගෙන්න |
| පිරිසිදු වී තැනෙකැ | ඉන්න |
| අකුරට බුහුමන් | කරන්න |
| නුවණ වඩින දොර | හරින්න |

යනුවෙන් කුමාරතුංග මුනිදාස පඬිතුමා ''අකුරු මහිමයෙන්'' දරුවනට දෙන මේ ඔවා නුවණින් සලකා බැලිය යුතු ය.

මිනිසා භාවිත කරන මෙවලම් (උපකරණ) අතර ප්‍රධානත්වය ගන්නේ භාෂාවයි. මිනිසා සිතන්නේ භාෂාවෙනි. භාෂාව නිරවුල් නැත්නම් මිනිසා සිතන දේත් අවුල් සහගත වන බවයි දාර්ශනිකයන් ගේ මතය. අනෙක තමයි, කිසියම් ජාතියක අනන්‍යතාව පවතින්නේ ඒ ජාතිය ව්‍යවහාර කරන භාෂාව පදනම් කරගෙන වීම. සිංහල ජාතිය කියන්නේ සිංහල බස කතා කරන පිරිසට යි. දෙමළ බස කතා කරන ජන සමූහයා දෙමළ ජාතිය යි. කැටලෝනියන්වරුන් සඳහන් කරන්නේ කැටලෝනියන් භාෂාව ඔවුන් ගේ පැවැත්මේ ආධ්‍යාත්මික පදනම ද වන බව යි.

ජේ. ඒ. ෆිෂ්මන් නමැති වාග්වේදියා ඔහු ගේ "language and Nationalism" නම් පොතේ සඳහන් කැර ඇති පහත සඳහන් ප්‍රකාශය ළමා ඔබ ගේත් අවධානය යොමු විය යුතු ඉතා වැදගත් අදහසකිඃ ''අන්‍යයකු ගේ භාෂාව ජාතියක් මත පැටවීම ඔවුන් ගේ ඉතිහාසය සුළඟේ පා කොට යැවීමකි. ඔවුන් ගේ අනන්‍යතාව සැම අතින් ම මුලිනුපුටා දැමීමකි. ඔබේ ජන්ම භාෂාව අමතක කොට පිටත්තරයන් ගේ භාෂාවක් ඉගැනීම වහල්කමේ පහත් ම ලාංඡනය වන්නේ ය.'' (පරිවර්තනය ඃ මහාචාර්ය කේ. එන්.ඕ. ධර්මදාස මහතා)

ජාතියක සංස්කෘතික ප්‍රවාහයේත් ප්‍රධාන සාධකය වන්නේ භාෂාව ම බව අප මෙහි දී සිහිපත් කළ යුතු යි. භාෂාව වූ කලි කවර වුව ද ජාතියක සංස්කෘතික ප්‍රකාශනය වන බව සමාජ වාග්වේදීන් ගේ අදහස යි.

භාෂාව ධාතු කරඬුවක් නො වුවත් භාෂාවට අප බුහුමන් කළ යුත්තේ ඇයි ද යන්න වටහා ගැනීමට ඉහත සඳහන්

කරුණු ටික වුව ද ප්‍රමාණවත් ය. අකුරු සහිත පත්‍රිකාවක්, පුවත්පත් පිටුවක් මත හිඳ ගැනීම පවා අශීලාචාර ක්‍රියාවක් ලෙස පැරැණියන් සලකා ඇත්තේ එ හෙයිනි. කුමාරතුංග පඬිතුමා ඉහත කී ''අකුරු මහිමය'' පැදි පෙළෙහි මෙසේ ද සඳහන් කරයි.

නුවණ ලබා දෙන දෙවියෝ
අකුරු යැ ඉන් නොවනු වියෝ
එ අකුරු මැනැවින් සෙවියෝ
වෙති රට සලකන කිවියෝ

අකුරට (භාෂාවට) දැන් යටහත් ව හොඳින් ඉගෙන ගත්තොත් ඒ භාෂාව පසුව මෙහෙකරුවකු වී ඔබට වැඩ සලසා දෙන බවත්, ඔබේ හැම අදහස් ඉටු වන බවත් දහස් ගණනින් ඔබට සැප ද සැලැසෙන බවත් එහි සඳහන් කැර ඇත්තේ මෙ පරිද්දෙනි.

අකුරට දැන් වන්නැ දාස
අකුරු පසු වැ වේ යැ දාස
සිදු වෙයි ඔබ හැම අදාස
පැමිණෙයි සැප දාස දාස

පින්වත් දරුවෙනි, ඔබ ඔබ ගේ භාෂාවට ගරු බුහුමන් කරන්නා සේ ම, අන් අය ගේ භාෂාවට ගැරහීම ද නොහොබිනා ක්‍රියාවක් බව සිතට ගන්න. හැම ජාතිකයකු ම තමා ගේ භාෂාවට ගෞරව කරන බැවිනි. ඔබත් එලෙස ඔබ ගේ සිංහල භාෂාවට ගරු බුහුමන් කරන කෙනෙක් දැයි මඳක් සිතා විමසා බලනු මැනැවි.

''මා බස හෙළ බස අන් කිසි බසකට
මා රැස හෙළ රැස අන් කිසි රැසකට
මා දෙස හෙළ දෙස අන් කිසි දෙසකට
මේ හිස නො නමමි, නො නමමි කිසි විට''



# ඔබා දෙමු පරහට
# තමා සම්මතෙහි පිහිටා සිට

කොස්ගම, බොල්ලතාව ශ්‍රී සුභද්‍රා දහම් පාසලේ උප ප්‍රධානාචාර්යාණි
**ශාස්ත්‍රපති එච්.එම්. සුජාතා නාලිනී මහාත්මනිය**

''පින්වත් ගෞතමයන් වහන්ස, අපි දරුමල්ලන් ඇති දැඩි කරන, සුවඳ විලවුන් ඇඟ ගල්වන, ඉතා වටිනා සියුම් කසී සළු හඳින, රන්රිදී මසුකහවනු භාවිත කරමින් සුඛෝපභෝගී ගිහි ජීවිතයක් ගත කරන අය. මෙසේ පස්කම් සැප විඳිමින් මෙලොව ඉතා සතුටින් ජීවත්වන අපගේ මරණින් පසු පරලොව ජීවිතයත් සුවෙන් සතුටින් ගත කිරීම සඳහා අවශ්‍ය වන දහමක් දේශනා කරන්න.'' යනුවෙන් වරක් බුදුරදුන් කොසොල් රට වේළුද්වාර නම් බමුණු ගමට වැඩම කළ අවස්ථාවක දී උන්වහන්සේ හමුවට පැමිණි වේළුද්වාර ගම් වැසියන් බුදුරදුන්ට මෙසේ ආරාධනා කළා.

ඔවුන් ගේ අභිප්‍රාය තේරුම්ගෙන ඒ ආරාධනාව පිළිගත් බුදුරදුන් 'හොඳයි කියන්නම් (භාසිස්සාමි) එසේනම් අසන්න. (තං සුණාථ) අසා හොඳින් සිත්හි තබා ගන්න. (සාධුකං මනසිකරෝථ) මැනැවින් සිත්හි ධාරණය කරගෙන ඒ දහමට අනුව දිවිමග යහපත් කර මෙලොව සුවපත් වී පරලොව දිවියත් සැපවත් කර ගන්නැ'යි දෙලොව දියුණුව පිණිස හේතුවන, බෙහෙවින් උපකාරීවන වේළුද්වාර නම් සූත්‍ර ධර්මය දේශනා කළා.

බෝසත් දුවේ, පුතේ, බුදුපියාණන් වහන්සේ වේළුද්වාර වැසියන්ට දේශනා කළ ඒ සූත්‍රධර්මයේ අඩංගු දහම මැනැවින් සිත්හි ධාරණය කර ගනිමු. (ධාරෙථ) ධාරණය කරගෙන අපේ ජීවිතත් යහපත් කර ගැනීමට අධිෂ්ඨාන තබා ගනිමු.

මේ තුළ අඩංගු වන්නේ පළමුව තමා ගැන සිතා ඒ අනුව අනුන් ගැනත් කල්පනා කොට පිළිපැදීමේ ක්‍රමවේදයක්. එය සඳහන් කර තිබෙන්නේ ''අත්තූපනායික ධර්මපර්යාය'' නමින්. අප ජීවත්වන සංකීර්ණ සමාජ රටාව තුළ අපට මෙමඟින් ඉතා වටිනා පාඩමක් උගන්වනවා.

අපි අපේ ජීවිතයට ඉතා ම ආදරෙයි. ප්‍රියයි. එතරම් ආදරයක් අප අනුන්ගේ ජීවිතවලට දක්වන්නේ නැහැ. මදුරුවකු පවා මැරීමේ චේතනාවක් අප තුළ සැණෙකින් පහළවන්නේ ඒ නිසයි. අප අප සතු දේ පණ මෙන් රැක ගන්නා නමුත් අන් සන්තක දේ ඉඩ ලද සැණෙකින් තමන් සතු කර ගැනීමට පසුබට වන්නේ ද නැත. අප අපගේ සම්පත, සතුට කෙරෙහි උදම්වන අතර ඒ සම්පත සතුට ම අනුන් තුළ ඇති බව දුටු සැණකින් ඔවුන්ට ඊර්ෂ්‍යා කිරීමට පෙළඹෙනවා. මේ අපගේ පෘථග්ජන ස්වභාවයයි. බුදුරදුන් වේළුද්වාර සූත්‍රය ඇසුරින්, අප තුළ ඇති එවන් පහත් ස්වභාවයන් ඉවත් කරවන්නේ තමා ම උපමා කරගනිමින්, අප ආර්ය මාර්ගයට යොමු කරවමින්.

''මම ජීවත් වෙන්න කැමතියි. මම දුක් විඳින්න කැමති නැහැ. මම බොහෝ කලක් ජීවත්වෙන්න කැමතියි. මම මැරෙන්න කැමති නැහැ. අන් අයත් ඒ වගේමයි. එහෙමනම් ඇයි මම අනුන්ගේ ජීවිත විනාශ කරන්නේ. අනුන්ගේ ජීවත්වීමේ අයිතිය උදුරා ගන්නේ. මෙහෙම හිතලා මම ප්‍රාණඝාතයෙන් වෙන්වෙනවා. (අත්තනා පාණාතිපාතා පටිවිරතො හොති) අනුනුත් ප්‍රාණඝාතයෙන් වළක්වනවා.

(පරෙ ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති) ඒ විතරක් නෙවෙයි, අනුන් ප්‍රාණඝාතයෙන් වැළැක්වීම සඳහා පරපණ නොනැසීමේ අගයත් වර්ණනා කරනවා. (පාණාතිපාතා වෙරමණියා වණ්ණං භාසති) කියලා මේ තුන් ආකාරයට ම පරපණ නැසීමෙන් වැළකී සිටීමේ ත්‍රිවිධ කායසමාචාරයයි අප ශාන්තිනායක බුදුපියාණන් වහන්සේ මෙහි දී පළමුවෙන් ම දේශනා කර වදාළේ.

දෙවන ධර්ම කරුණ වන්නේ සොරකමින් වැළකීමේ අගයයි. මා සතු දේ යමෙක් ගන්නවාට මා අකමැතියි. යමකු මා සතු දේ ගත්තොත් මා ඔවුන් කෙරෙහි තරහ වෛර බැඳ ගන්නවා. හිරිහැර පීඩා කරන්න පෙළඹෙනවා. ඒ වගෙමයි අන් අයත්. ඔවුන් සතු දේ මා ගත්තොත් ඔවුනුත් ඒ වගේම මට වෛර කරාවි. හිරිහැර දුක් පීඩා ගෙනදේවී. ඒ නිසා මා අන් සතු දේ සොරසිතින් ගැනීම සුදුසු නැහැ'යි සිතා තමන් සොරකමින් වැළකී අනුනුන් වළක්වා සොරකමේ විපාක, සොරකම් නොකිරීමේ ආනිශංස ප්‍රකාශ කරමි. කියන මේ තුන් ආකාරයෙන් සොරකමෙන් වැළකීමේ ත්‍රිවිධ සමාචාරය මේ දේශනාවෙන් පැහැදිලි කළා.

වැරදි කම් සැප නොසෙවීමේ අගය තුන්වන කාය සමාචාරය ලෙස මේ සූත්‍ර ධර්මයේ අඩංගු වෙනවා. වත්මන් සමාජය දෙස බලන විටත් අපට පෙනීයන දෙයක් තමයි, සමාජ දුරාචාරයට හේතුව වැරදි කාම සම්පත් කෙරෙහි ඇලීම, ගැටීම.

අප ශාන්තිනායක තිලෝගුරු බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන් මේ දහම් කරුණු තුන එනම් පංචසීල ප්‍රතිපත්තියේ පළමුවන ශික්ෂා පද තුන යමෙක් ආරක්ෂා කරන්නේ නම් ඒ සමාජය කෙතරම් සදාචාර සම්පන්න වේ ද යන්න මේ තුළින් මනාව පැහැදිලි වෙනවා.

උන්වහන්සේ දෙසූ පළමු දහම් කරුණින් පුද්ගල ජීවිත ආරක්ෂාව ඇතිවෙනවා. දෙවැන්නෙන් දේපළ ආරක්ෂාව සිදුවෙනවා. තුන්වන කරුණින් නිදහස් සාමකාමී සදාචාර සම්පන්න සමාජයක් බිහි වෙනවා. බොහෝ සෙයින් සමාජයක් දූෂිත වෙන්නේ මේවායින් ඈත්වන විටයි.

යම් රටක මිනීමැරුම්, සොරකම් මංකොල්ල කෑම්, කාමාපරාධ නැත්නම් ඒ රට වැසියන්ට උසස් මානසික නිදහසකින් යුතුව, තමන්ගේ දෛනික කටයුතු කරගෙන යන්නට පුළුවන්. එදිනෙදා ජීවිතය සැහැල්ලු වන විට මෙලොව සුව සඳහා පින්කම්, කුසල් දහම් රැස් කරනවා. පරලොව ජීවිතයත් සැපවත් වීම සඳහා ඒ පින්කම් බොහෝ සෙයින් උපකාර වෙනෙවා.

මේ වෙළුද්වාර සූත්‍රයේ සඳහන් ත්‍රිවිධ කාය සමාචාරය, චතුර්විධ වචී සමාචාරය, චතුර්විධ ආකංඛනීය ධර්ම යන දහම් කරුණු අතරින් එකක් පමණයි. ඒ දහම් ඇසූ වේළුද්වාර වැසියන් ඉතාම සතුටට පත්වුණා. අඳුරේ සිටි අපට නිවැරදි මඟ දැකීමට මෙ දහම දැල්වූ පහනක් වගෙයි. වැරදි මඟක ගමන් කළ අප නිවැරදි මාර්ගය දැක්කා. බෙහෙවින් සතුටට පත්වුණා.

ඉතින් දුවේ පුතේ, අපිත් වේළුද්වාර වැසියන් වගේ මේ දහමින් පල නෙළා ගනිමු. අපි අප අතින් සිදුවන පව්කම්වලින් වැළකෙමු. අප ඇසුරේ සිටින අයට කල්‍යාණ මිත්‍රයකු වී ඔවුනුත් වරදින් වළක්වා ගනිමු. ඒ පමණක් නෙවෙයි, වරදින් වැළකීමේ ආනිශංස පෙන්වා දී මේ අත්තූපනායික ධර්ම පර්යායෙහි යෙදෙමින් මෙලොව පරලොව සුව සදා අප බලාපොරොත්තුවන අවසාන නිෂ්ඨාව වන නිර්වාණාවබෝධය සඳහා උත්සාහ කරමු.

**ඔබ සැමට තෙරුවන් සරණයි.**



# බෞද්ධ ළමයා
# උපදේශන මණ්ඩපය

**''විදසුන් ''විසිනි**

**මම ඉතිහාසය, සාහිත්‍ය, බුද්ධ ධර්මය වැනි ලිවීම තිබෙන විෂයවලට කැමතියි. නමුත් ගණිතය, විද්‍යාව වැනි මොළය වෙහෙසන විෂයවලට අකමැතියි. අපේ පන්තියේ සමහරු ලියන්න හරිම කම්මැළියි. එහෙත් මොළය වෙහෙසා ගණන් හදන්න හරි කැමතියි. මේ වෙනස කුමක්ද?**

පින්වත් දුවේ, පුතේ, මානව විද්‍යාව අනුව අපේ මොළයේ පිහිටීම විවිධ අයට විවිධ ආකාරයි. සමහරුන් ගේ මොළයේ පිහිටීම අනුව ඒ අය උපතින් ම සාහිත්‍ය, කලා, නිර්මාණ ආදියට නැඹුරු වෙනවා. තවත් අය ගැඹුරු චින්තනයටත්, තවත් අය විවිධ තාක්ෂණයටත් තවත් අය ගණිතය වැනි මොළය ක්‍රියාත්මක වන කටයුතුවලටත් ආදී වශයෙන් විවිධ නැඹුරුතා දක්වනවා. ඒ අනුව මොළයේ පිහිටීම ඒ ඒ අයගේ රුචිකත්වයට බලපෑම් කරනවා. ඒ ලෙස ම අපට කුඩා කල සිට ම ලැබුණු යම් යම් ආභාසයන් අනුවද ඒ ඒ රුචිකත්වයන් වෙනස් වෙනවා.

දුවේ, පුතේ, මෙහිදී ඉතා ම වැදගත් දෙයක් තමයි තමන් දක්ෂ ක්ෂේත්‍රය තෝරාගැනීම. හැම දෙනාට ම වෛද්‍යවරුන්, ඉන්ජිනේරුවන් වීමට බැහැ. තම තමන්ට සුවිශේෂ වූ විෂය පාරාසයක් තිබෙනවා. දෙමාපියන් ගේ බලපෑම මත හෝ සමාජ තත්ත්වය, මිත්‍රයින්ට බලපෑම් ආදී හේතු නිසා දූ පුතුන්ට නිවැරැදි ක්ෂේත්‍රය තෝරා ගැනීමට නොහැකි වුණොත් අනාගතේ දී ලොකු අමාරුවක වැටෙන්නට ඉඩ තිබෙනවා.

හැබැයි තම තමන්ට ස්වාධීන විෂය පරාසයක් තෝරා ගැනීමට හැකියාව ලැබෙන්නේ අපේ රටේ උසස් පෙළ අංශයේ දූ පුතුන්ට පමණයි. සාමාන්‍ය පෙළ විභාගය දක්වා දූ පුතුන් මූලික විෂයයන් සෑම එකකට ම ලිවිය යුතු වෙනවා. එහි දී තමන් දුර්වල විෂයයන් මැනැවින් තෝරා ගන්න. අපහසුවෙන් නමුත් එහි වැඩි වැඩියෙන් අභ්‍යාසයෙහි යෙදෙන්න. උදාහරණ ලෙස මොළය වෙහෙසීමට අපහසු කෙනා වැඩි වැඩියෙන් ගණන් සෑදීම, විද්‍යාත්මක සූත්‍ර විසඳීම වැදගත්. ලිවීමට අපහසු කෙනා වැඩි වැඩියෙන් රචනා, විචාර ප්‍රශ්න ආදිය ලිවීම වැදගත්. උපරිම නිපුණතාවක් දැක්වීමට නොහැකි වුවොත් පසුබට නොවන්න. සතුටුදායී ඉලක්කයකට ළඟා විය හැකි වෙනවා. ඒ අතරම ඔබ හොඳින් සමත්කම් දක්වන විෂය ක්ෂේත්‍රය ද අමතක නොකරන්න. සතතාභ්‍යාසය නැතිවන විට ඒ හැකියාවන් ද මොට වී යාවි. එහි හොඳින් නිරතව උපරිම දක්ෂතාවකට ළඟා වන්න.

තව ද සාමාන්‍ය පෙළ විෂය පරාසය තුළ උසස්පෙළ, විශ්වවිද්‍යාල ආදී ගැඹුරු මට්ටමින් විෂය අධ්‍යනයක් සිදු වන්නේ නැහැ. සෑම විෂයකම පාහේ මූලික සංකල්ප අධ්‍යයනයක් තමයි සිදු වන්නේ. එම නිසා ඔබ රුචි නොවන විෂය ක්ෂේත්‍රයක වුව ද උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකියාවක් නැහැ.

සියලු විෂයයනට 'ඒ' සාමර්ථ්‍යය ගත් පමණින් විද්‍යා / ගණිත අංශවලින් උසස් අධ්‍යාපනය හැදෑරීමට ඉක්මන් විය යුතුත් නැහැ. හොඳින් සිතා බලා දෙමාපිය ගුරුවර ආදීන් ගේ අවවාද ද ලබා ඔබේ ගමන ඔබ ම තීරණය කරන්න. උසස් ම ප්‍රතිඵල ලබමින් සාමාන්‍ය පෙළ කඩයිම ජයගත් දරුවන් කලා අංශයෙන් උසස්පෙළ හදාරා සාර්ථක අනාගතයකට පියනැඟූ අවස්ථා අපමණයි. දූ පුතුනි ''සක්කෝ'' ගුණය ගැන කියන මේ කෙටි කවිය හොඳින් සිහියේ තබා ගන්න.

"පුළුවනි පුළුවනි - මට බැරි දේ නැහැ
නෑ බෑ වදනක් - මගේ පොතේ නැහැ"